// ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,092 — 1960 මාර්තු 25 වැනි සිකුරාදා — 25.3.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගතහැකි පරිදි, සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | | පිට |
|---|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන | ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් | ... | 381 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් | | 382 |
| වෙනත් පත් කිරීම් ... | ... ... | 382 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය | ... | — |

| | | | පිට |
|---|---|---|---|
| ආණ්ඩුවේ නිවේදන ... | ... | ... | 382 |
| මිල පාලන දැන්වීම් ... | ... | ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා | ... | ... | — |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ... | | ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් | ... | ... | 383 |
| " සුරාබදු ආඥාපනත " පිළිබඳ දැන්වීම් ... | | ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම්

**1960 අංක 131**

අංකය : ඕ.21/රෙක් ඩ/92.

### යුධ හමුදාව — නිත්‍ය භට සේනාව — අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් භාරගන්නා ලද කොමිෂන් බලපත්‍ර ලත් ධුරයකින් ඉල්ලා අස්වීමක්

**1960 ජනවාරි මස 1 වැනි දින සිට, කොමිෂන් බලපත්‍ර ලත් ධුරයකින් ඉල්ලා අස්වීමක්**

කපිතාන් සී. එම්. ඩී. තිස්, සී.ඒ.එම්.සී.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

එච්. ඊ. තෙන්නකෝන්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

කොළඹ,
1960 මාර්තු මස 11 දින.

---

**1960 අංක 132**

අංකය : ඕ. 42/රෙක් ඩ.

### නිලධාරියෙක් පත්කිරීමක්—රාජකීය ලංකා නාවුක හමුදාව

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් රාජකීය ලංකා නාවුක හමුදාවේ පහත සඳහන් කරන ලද පත්කිරීම අනුමත කොට තිබේ.

1960 මාර්තු මස 8 වැනි දින සිට රාජදියන් වහන්සේගේ ලංකා සේවයෙහි නියුක්ත "එළාර" නෞකාවේ අණදෙන නිලධාරි තැන වශයෙන් සහ උතුරු ප්‍රදේශයේ අණ දෙන නිලධාරි තැන වශයෙන් :—

ලෙප්ටිනන්ට් (එන් ඩී) පී. ඩී. නැනායක්කාර, රාජකීය ලංකා නාවුක හමුදාව.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

එච්. ඊ. තෙන්නකෝන්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

කොළඹ,
1960 මාර්තු මස 14 දින.

---

**1960 අංක 133**

අංකය : ඕ. 32/රෙක් ඩ.

### රාජකීය ලංකා නාවුක හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්

1960 මාර්තු මස 8 වැනි දින සිට, තාවකාලික ලෙප්ටිනන්ට් කොමාන්ඩර් වශයෙන් :—

ලෙප්ටිනන්ට් (එන් ඩී) පී. ඩී. නැනායක්කාර, රාජකීය ලංකා නාවුක හමුදාව.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

එච්. ඊ. තෙන්නකෝන්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

කොළඹ,
1960 මාර්තු මස 14 දින.

1960 අංක 134

අංකය : ඩී. 31/රෙක් ට්.

## රාජකීය ලංකා නාවුක හමුදාව—අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද පළමු තත්ත්වයට පැමිණවීමක්

1960 මාර්තු මස 8 වැනි දින සිට, රාජකීය ලංකා නාවුක හමුදාවේ පළමු තත්ත්වය වන ලෙප්ටිනන්ට් පදවියට පැමිණවීම.

තාවකාලික ලෙප්ටිනන්ට් කොමාන්ඩර් එම්. සී. ගෞදර්, රාජකීය ලංකා නාවුක හමුදාව.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

එච්. ඊ. තෙන්නකෝන්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

කොළඹ,
1960 මාර්තු මස 14 දින.

---

## අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම්

1960 අංක 135

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත් කිරීම් කර ඇත්තේ ය :—

අංකය : සිජේපි/එස්. 24/59.

එම්. ඒ. එම්. හුසේන් මහතා නැවත වැඩ බාරගන්නා තුරු, හෝ නැවත නියමයක් කරන තුරු, එස්. සෙල්ලයියා මහතා 1960 මාර්තු 14 වැනි දින සිට, කොළඹ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයේ හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයේ, කොළඹ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයේ හා කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයේ වැඩ බැලීමට.

අංකය : ජේඑල්/65/48.

පී. ශ්‍රී ස්කන්ද රාජා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වී. මුත්තුසාමිපිල්ලෙයි මහතා 1960 මාර්තු 14 වැනි දින සිට 20 වැනි දින දක්වා යාපනේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, යාපනේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා යාපනේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල්. 70ඒ/51.

සී. බී. වල්ගම්පාය මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එෆ්. වී. එච්. ලාබ්‍රොයි මහතා 1960 මාර්තු 14 වැනි දින නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, නුවරඑළියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, නුවරඑළියේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා බඳුල්ල-හල්දුම්මුල්ල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය : ජේඑල් 37ඒ/55.

පී. මාරපන මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. එච්. ප්‍රනාන්දු මහතා 1960 මාර්තු 17 වැනි දින සිට, කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට. කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය : පීඑල්/එස්. 10/53.

එල්. ඒ. පී. ද අල්විස් මහතා වෙනත් රාජකාරිවල යෙදී සිටින බැවින්, ඩබ්ලිව්. ඩී. අබේගුණවර්ධන මහතා 1960 මාර්තු 11 වැනි දින, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ, සල්පිටි කෝරලේ හා කොළඹ ආදායම් පාලක නිලධාරිතුමාගේ කොට්ඨාශයේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එස්. 10/53.

එල්. පී. ඒ. ද අල්විස් මහතා වෙනත් රාජකාරිවල යෙදී සිටින බැවින් සී. සැන්ට්. ජේ. පුවිමානසිංහ මහතා 1960 මාර්තු 15 වැනි දින කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරලේ, සල්පිටි කෝරලේ හා කොළඹ ආදායම් පාලක නිලධාරිතුමාගේ කොට්ඨාශයේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එච්. 3/48.

ඒ. සෝමර් වන්නියසිංකම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ඒ. අලගයියා මහතා 1960 මාර්තු 15 වැනි හා 16 වැනි දිනයන් හි, මඩකලපු දිස්ත්‍රික්කයේ එරාවූර් කෝරලෙයි, බින්තැන්න පත්තුවේ හා උතුරු මාන්මුනේ පත්තුවේ ගම්බද උසාවියේ සභාපති ධුරයේ වැඩ බැලීමට.

එස්. ආර්. විජේයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1960 මාර්තු 16 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය—573,
කොළඹ 12.

---

## වෙනත් පත්කිරීම්

1960 අංක 136

ඊ.බී/ඒ. 204/2.

අර්ථ නිරූපන ආඥාපනතේ දෙවන පරිච්ඡේදය 10 බී වැනි වගන්තිය යටතේ අංක 10,123 සහ වර්ෂ 1950 ජූලි මස 14 වැනි දින දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරණ ලද නිවේදනයෙන් තමන් වෙත පැවරී ඇති බලතල අනුව ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙහි ස්ථිර ලේකම් විසින් පහත සඳහන් පත් කිරීම් කර ඇති බව මෙයින් දනුම් දෙනු ලැබේ.

රත්නපුර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත තැනගේ කාර්යාල සහකාර තැන්පත් ඒ. බී. ඒ. මැදිවක මහතා, ස්වකීය රාජකාරි වලට අතිරේක වශයෙන්, 1960 මාර්තු මස 1 වැනි දින සිට රත්නපුරය පාලන දිස්ත්‍රික්කය සම්බන්ධයෙන් නියෝජ්‍ය පිස්කල්.

ඞී. සී. ඇල්. අමරසිංහ,
ස්ථිර ලේකම් වෙනුවට.

1960. 3. 15 වැනි දින,
ස්වදේශ කටයුතු භාර ඇමති කාර්යාලයේ දී ය.

---

## ආණ්ඩුවේ නිවේදන

### 1945 අංක 45 දරණ සමුපකාර සංවර්ධන කොමසාරිස් (බලතල නිරූපන) ආඥාපනත

නියෝගය

1947 සැප්තැම්බර් 24 වැනි දිනය හා 9,773 අංකය දරණ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කෙරුණු ප්‍රකාශනයෙන් සංශෝධිත ප්‍රකාර 1945 අංක 45 දරණ සමුපකාර සංවර්ධන කොමසාරිස් (බලතල නිරූපන) ආඥාපනතේ 3 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති තැන් පත් විජයානන්ද දහනායක වන මම, මෙම නියෝගය මගින් 1959 දෙසැම්බර් මස 18 වැනි දිනය හා 12,010 අංකය දරණ ගැසට් පත්‍රයේ පළ කෙරුණු නියෝගයෙන් අන්තිම වරට සංශෝධනය කරනලද ප්‍රකාර 1953 දෙසැම්බර් 11 වැනි දිනය හා 10,621 අංකය දරණ ගැසට් පත්‍රයේ පළ කළ නියෝගය ඊට යා කළ උපලේඛනයේ 1 වැනි තීරයේ අගට පහත දැක්වෙන කොටස ඇතුළත් කොට, සංශෝධනය කරමි.

"දොන් සීබට් වාල්ස් ගුණසේකර මහතා"

වි. දහනායක,
රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති.

1960.3.16 වැනි දින,
කොළඹ.

මගේ අංකය : ඊබී/ආර්/4/59.

## බදුල්ලේ පරිපාලන දිස්ත්‍රික්කයේ පිහිටි හපුතලේ හා උඩුකිඳ යන ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශ දෙක සකස් කිරීම

1960 ජනවාරි මස 1 වෙනිදා සිට ඌව පළාත බදුල්ල හා මොණරාගල යන නමින් පරිපාලන දිස්ත්‍රික්ක දෙකකට බෙදීම හේතු කොට ගෙන අළුතෙන් ඇති කළ හපුතලේ ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය හා නැවත සකස් කළ උඩුකිඳ ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය පිළිබඳ විස්තර මහජනයාගේ දැනගැනීම සඳහා පහත දක්වනු ලැබේ :—

(අ) 1. ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ නම : හපුතලේ.

2. මෙම ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාලයේ පිහිටීම : හල්දුම්මුල්ල.

3. මෙම ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයට අඩංගුවන ගම්මුලාදැනි කොට්ඨාශ නම් :—

මහපළාත කෝරළේ පිහිටි:
- කදුරුගමුව
- හපුතලේගම
- කහගොල්ල
- කැබිල්ලෙවෙල
- කිනිගම
- ගොරඩිය කුඹුර සහ බණ්ඩාරවෙල වටුම

කන්දපල්ල කෝරළේ පිහිටි:
- ගම්පහ
- නිකපොත
- කොස්ලන්ද
- කිරවනාගම
- හොරගුනේ
- හල්දුම්මුල්ල
- කලුපහන

4. මෙම ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය තුළ පහත සඳහන් මහේස්ත්‍රාත් උසාවි හා ගම්බද උසාවි මගින් අධිකරණ බලය පවතිනවා ඇත :—

බදුල්ල-හල්දුම්මුල්ල මහේස්ත්‍රාත් උසාවිය.

හල්දුම්මුල්ලේ ගම්බද උසාවිය.

බණ්ඩාරවෙල ගම්බද උසාවිය.

5. මෙම ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයට පහත සඳහන් ගම්කායර් සභා ප්‍රදේශ ඇතුළත් වනු ඇත :—

කන්දපල්ල අංක එක ගම්කායර් සභාව.

කන්දපල්ල අංක දෙක ගම්කායර් සභාව.

මහ පළාත ගම්කායර් සභාව.

6. මෙම ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය පහත සඳහන් ඡන්ද කොට්ඨාශ ප්‍රදේශ වලට ඇතුළත් වනවා ඇත :—

අංක 127 දරණ බණ්ඩාරවෙල ඡන්ද කොට්ඨාශය.

අංක 128 දරණ හපුතලේ ඡන්ද කොට්ඨාශය.

(ආ) 1. ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ නම : උඩුකිඳ.

2. මෙම ප්‍රාදේශීය ආදයම් නිලධාරි කාර්යාලයේ පිහිටීම : වැලිමඩ.

3. මෙම ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයට අඩංගුවන ගම්මුලාදැනි කොට්ඨාශ නම් :—

ගම්පහ කෝරළේ පිහිටි:
- මස්පන්න
- වෑකලාව
- වැවේගම
- බඹරපනේ
- තුප්පිටිය

මැදපළාත කෝරළේ පිහිටි:
- කිරවනාගම
- හපුගොල්ල
- පරනගම
- උඩුහාවර.

යටිපළාත කෝරළේ පිහිටි:
- කුමාරපට්ටිය
- පේරවැල්ල
- ඌමා ඇල.

උඩපළාත කෝරළේ පිහිටි:
- දෙහිපොල
- විදුරුපොල
- පාලුගම
- අඹේවෙල
- තෙන්නකෝන්වෙල
- පාලුගම වටුම
- තැන්නෙකුඹුර
- නෑදුන්ගමුව.

දෙහිවිනි පළාත කෝරළේ පිහිටි:
- කොටවෙර
- උඩපේරුව
- ඇටම්පිටිය
- දෙහිවින්න
- මලිත්ත

දඹවිනි පළාත කෝරළේ පිහිටි:
- දික්කාපිටිය
- කැටකැල
- මීරහවත්ත
- මල්පොත
- ගුරුතලාව
- රත්කරව්ව
- ඔහිය
- බොරලන්ද

4. මෙම ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය තුළ පහත සඳහන් මහේස්ත්‍රාත් උසාවි මගින් අධිකරණ බලය පවත්වනවා ඇත :—

බදුල්ල-හල්දුම්මුල්ල මහේස්ත්‍රාත් උසාවිය.
වැලිමඩ ගම්බද උසාවිය.
තුප්පිටිය ගම්බද උසාවිය.

5. මෙම ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයට පහත සඳහන් නගර සභා හා ගම්කායර් සභා ප්‍රදේශ ඇතුළත් වනවා ඇත.

වැලිමඩ නගර සභාව.
මැදපළාත ගම්කායර් සභාව.
යටිපළාත ගම්කායර් සභාව.
උඩපළාත ගම්කායර් සභාව.
දෙහිවිනි පළාත ගම්කායර් සභාව.
ගම්පහ ගම්කායර් සභාව.
දඹවිනි පළාත ගම්කායර් සභාව.

6. මෙම ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය පහත සඳහන් ඡන්ද කොට්ඨාශ ප්‍රදේශවලට ඇතුලත් වනවා ඇත :—

අංක 125 දරණ ඌවපරනගම ඡන්ද කොට්ඨාශය.

අංක 126 දරණ වැලිමඩ ඡන්ද කොට්ඨාශය.

ස්වදේශ කටයුතු භාර අමාත්‍යාංශය,
ටොරින්ටන් චතුරශ්‍රය,
කොළඹ 7.
1960 මාර්තු මස 14 වෙනි ද.

එස්. සී. ප්‍රනාන්දු,
ස්ථිර ලේකම්.

---

## දැන්වීමයි

කුරුණෑගල අධිකරණ කොට්ඨාශය ඇතුළත ඉංග්‍රීසි භාෂාවෙන් නොතාරිස් ධුරයේ කටයුතු කිරීමට බලය ලත් දොන් චාර්ල්ස් එඩ්වර්ඩ් සේනානායක මහතාට එම අධිකරණ කොට්ඨාශය ඇතුළත සිංහල භාෂාවෙන් නොතාරිස් කෙනෙකු වශයෙන් කටයුතු කිරීමට ද ගරු ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය තුමා විසින් අවසර දී තිබේ.

එස්. සී. ප්‍රනාන්දු,
ස්වදේශ කටයුතු පිළිබඳ ස්ථිර ලේකම්.

1960 මාර්තු මස 14 වැනි දින,
කොළඹ දීය.

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## 1946 යේ අංක 32 දරණ වාරිමාර්ග ආඥාපනත

රත්නපුර දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති තැන්පත් ලයනල් බාත්‍රොප් ඒ අබයරත්න මහතා විසින් 1946 යේ අංක 32 දරණ වාරිමාර්ග ආඥාපනතේ අංක 113 දරණ වගන්තියේ ප්‍රකාර මා වෙත පවරා ඇති බලතල අනුව, රත්නපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන්පත් බී. සී. ආර්. ජයසිංහ වන මම, සටහන් වාරිමාර්ග ආඥාපනතේ අංක 15 (1) (ඒ) දරණ වගන්තියේ ප්‍රකාර පහත දක්වෙන උපලේඛණයෙහි සඳහන් යෝජනාව අනුමත කරමි.

බී. සී. ආර්. ජයසිංහ,
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන,
රත්නපුර දිස්ත්‍රික්කය.

ගොවිජන සේවා කාර්යාලය,
බටුගෙදර, රත්නපුර,
1960. 3. 11.

### උප ලේඛනය

"1946 යේ අංක 32 දරණ වාරිමාර්ග පණතේ 5 වන කොටස යටතේ සකස් කරනු ලැබූ, රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරළේ දෙල් ලබෙඩ පිහිටි යෝජිත නාගස් අමුණ තැනීම අනුමත කිරීම සඳහා ඒ අමුණෙන් ප්‍රයෝජනය ලැබිය හැකි කුඹුරු පිහිටි පෙදෙසේ කුඹුරු හිමියෝ වන අපි අපේ මෙම රැස්වීමේදී එකී අමුණ තැනීම අනුමත කරන අතරම ඒ අමුණෙන් වැඩ කළ හැකි හැම කුඹුරක්ම රත්නපුර දිස්ත්‍රික්කයේ රජයේ දිසාපතිතුමන්ගේ සතුටට හේතුවන අයුරු වැඩ කිරීමටද එකඟ වෙමු."

## ආණ්ඩුවේ ආරෝග්‍යශාලාවලදී මියගිය රෝගීන්ට හිමි අයිතිවාසිකම් නොකියන ලද දේපලවල විස්තර

| ආරෝග්‍යශාලාවේ නම | රෝගියාගේ නම සහ විස්තර | මැරුන දිනය | දේපලවල විස්තර |
|---|---|---|---|
| පයඹාන්ත වෛද්‍යායතනය කතරගම | ස්ථිර පදිංචියට ස්ථාන යක් නැති වයස අවුරුදු 75ක් වන, ටිකට් අංකය: 96/13 දරණ ඇස්. වේළු පිල්ලෙ නමැති අය | 8.2.60 ... | මුදලින් රු. 410/- |

ඉහත සඳහන්වූයේ කතරගම, ආණ්ඩුවේ ආරෝග්‍යශාලාවේ සිට නැසීගිය රෝගියෙකුට හිමි, කිසිවෙක් අයිතිවාසිකම් කියන්නට ඉදිරිපත් නොවූ දේපල වල විස්තරයයි. මෙම ගැසට් නිවේදන දිනයේ සිට සති තුනක් ඇතුලත මීට යම් කෙනෙක් අයිතිවාසිකම් ඉදිරිපත් නොකළොත් එම මුදල රාජ සන්තක කරන බව මෙයින් දැනුම් දෙමි.

මෙයට,

ඇම්. පී. ද සිල්වා,
මාතර සෞ : සේ : අධිකාරි තුමා
වෙනුවට.

වර්ෂ 1960ක්වූ මාර්තු මස, 10 දින,
මාතර, සෞඛ්‍ය සේවාධිකාරි කාර්‍යාලයේදීය.

---

## අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය

### පොත් පිළිබඳ අනුමතිය අලුත් කිරීම

මේ මණ්ඩලය විසින් 1955 වර්ෂයෙහි නිකුත් කරන ලද සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පොත් වල තුන්වන අතිරේක නාමාවලියෙහි ඇතුළත් පොත් වල හා 1957 වර්ෂයෙහි නිකුත් කරන ලද පස්වන අතිරේක නාමාවලියෙහි ඇතුළත් අනුමතිය අලුත් කරන ලද පොත් වල හා වලංගු කාලය මේ වර්ෂය අවසානයේ දී කෙළවර වන බැවින්, පොත් මින් ඉදිරියටත් පාඨශාලාවන් හි භාවිතය පිණිස යෙදවීමට කැමතී ගත් කරුවන් විසින් හෝ ප්‍රකාශකයන් විසින් හෝ අනුමතිය අලුත් කිරීම සඳහා 1960 අප්‍රේල් 30 වැනි දිනට කලින් ඉල්ලුම් කළ යුතුය. තවද, මී ළඟ අනුමත පොත් නාමාවලිය 1960 නොවැම්බර මස අවසන් වීමට කලින් නිකුත් කිරීමට අදහස් කරන බැවින්, අනුමතිය බලා පොරොත්තුවෙන් ඉදිරිපත් කරන සියලු අලුත් පොත් සලකා බැලීම සඳහා 1960 ජූලි මස 15 වැනි දිනට කලින් මා වෙත ලැබිය යුතු බව ද මෙයින් දන්වමි.

ගුණපාල සේනාදීර,
අ.ග.ප්‍ර.උ.ම. ලේකම්.

1960 මාර්තු 15,
කොළඹ 2,
මැලේ වීදියේ
අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලයේ දී ය.

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

### දුම්රිය මාර්ගය හරහා මහා මාර්ගය වැටී ඇති ස්ථාන අළුත්වැඩියා කිරීම

කැළණිවැලි දුම්රිය මාර්ගයේ පන්නිපිටිය සහ මාලපල්ල දුම්රිය පළවල් අතර සැ. 10. ද. 56 දරණ, පන්නිපිටිය-බොරැල්ල පාර දුම්රිය මාර්ගය හරහා වැටී ඇති ස්ථානය වර්ෂ 1960ක්වූ මාර්තු මස 26වෙනි සෙනසුරාදා සවස සිට පසුදින උදය වෙනතුරු අළුත්වැඩියා කරණ හෙයින්, මෙම හරස් පාර සෙනසුරාදා රාත්‍රි 9 සිට ඉරිදා උදය 7 වෙන තුරු සියළු රථවාහනාදියට වසා තබනු ලැබේ. මෙම කාලය තුළදී රථ වාහනාදිය මහරගමට යන පරණ පාරෙන් සහ මස්කැටිය හන්දියෙන් ගමන් කළ යුතුයි.

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

### දුම්රිය මාර්ගය හරහා මහා මාර්ගය වැටී ඇති ස්ථාන අළුත්වැඩියාකිරීම

උතුරු දුම්රිය මාර්ගයේ මීසාලෙයි සහ චාවාකච්චේරි දුම්රිය පලවල් අතර සැ. 235 ද. 21 දරණ චාවාකච්චේරි-කච්චෙයි පාර දුම්රිය මාර්ගය හරහා වැටී ඇති ස්ථානය වර්ෂ 1960ක්වූ මාර්තු මස 27වෙනි ඉරිදා අළුත්වැඩියා කරණ හෙයින් එම දින උදය 9 සිට 11 දක්වා එම ස්ථානය හරහා යන රථවාහන ප්‍රවේසමින් ගමනාගමනය කිරීමට කට යුතු සලස්වනවා ඇත.

---

## විශෙෂ නිවේදනයයි

1960 අප්‍රේල් 13 වැනි බදාදා සහ අප්‍රේල් 15 වැනි සිකුරාදා ආණ්ඩුවේ නිවාඩු දිනයන් වන බැවින්, 1960 අප්‍රේල් මාසයේ තුන්වැනි සුමානයේ ගැසට් පත්‍රය, 1960 අප්‍රේල් 14 වැනි බ්‍රහස්පතින්දා නිකුත් කරන බැවින්, එහි පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1960 අප්‍රේල් 8 වැනි සිකුරාදා පස්වරු 4ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1960 මාර්තු 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.